## 1.6 හෙට්ටි ප්‍රජාවගේ භාෂණ දෙමළෙහිත් උතුරු- නැගෙනහිර ප්‍රදේශවල භාවිත වන භාෂණ දෙමළෙහිත් වර්තමාන කාල භේදය දැක්වීමේ ඇති විශේෂතා

එස්. ජේ. යෝගරාජා
වාග්විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

### ABSTRACT

1.0 අරමුණ

හෙට්ටි ප්‍රජාවගේ භාෂණ දෙමළෙහිත් උතුරු නැගෙනහිර, හලාවත, පුත්තලම, මීගමුව සහ කොළඹ යන ප්‍රදේශවල භාවිත වන භාෂණ දෙමළෙහිත් වර්තමාන කාල භේදය දැක්වීමේ ඇති විශේෂතා කවරේද යන්න පිළිබඳ අධ්‍යයනයක් කිරීම මෙහි අරමුණයි. මෙහිදී උතුරු නැගෙනහිර ප්‍රදේශවල භාවිත වන භාෂණ දෙමළෙහි වර්තමාන කාල භේදය දක්වන ආකාරයත් හෙට්ටි ප්‍රජාවගේ භාෂණයෙහි වර්තමාන කාල භේදය දැක්වීමේ දී ඇති විශේෂතා කවරේද යන්නත් සලකා බැලේ. මෙම පර්යේෂණය සඳහා යොදා ගෙන ඇත්තේ මීගමුව ප්‍රදේශයේ ජීවත් වන ක්‍රිස්තියානි හෙට්ටි ප්‍රජාවගේ භාෂණයත්, උතුරු නැගෙනහිර ප්‍රදේශ ආශ්‍රිතව ජීවත් වන ජනයා භාවිත කරන භාෂණයත් ය.

**2.0** උතුරු නැගෙනහිර ප්‍රදේශවල භාවිත වන භාෂණ දෙමළෙහි වර්තමාන කාල භේදය දැක්වීම

ක්‍රියා මූලයකට (verb stem) වර්තමාන කාලවාචි **–R-, -kkiR-, -yiR-** යන ප්‍රත්‍ය අතුරින් සුදුසු ප්‍රත්‍ය යෙදී එයින් පරව සංඛ්‍යාවාචි, පුරුෂවාචි සහ ලිංගවාචි ප්‍රත්‍ය වන **(na:n -an** මම) ,**(na:ŋkaL -am** අපි) - **(ni: -a:y** උඹ) - ( **ni:ŋkaL - i:ŋkaL -** ඔයා/ ඔයාලා) **(avar- ar-a:r** ඔහු) , **(ava- a:** ඇය) -, **(avayaL -inam** - එයාලා) - , **(atu - utu, um** උඕ) , **atuhaL- utuhaL, um** උන්) ආදී ප්‍රත්‍ය යෙදීමෙන් වර්තමාන කාලික ක්‍රියාපද සාදා ගැනෙයි. උතුරු-නැගෙනහිර භාෂණ දෙමළෙහි වර්තමාන කාලික පද සාධනය පහත ආකාරයට දැක්විය හැකියි.

ක්‍රියාමූලය + වර්තමාන කාලික ප්‍රත්‍ය + පුරුෂවාචි, සංඛ්‍යාවාචි සහ ලිංගවාචි ප්‍රත්‍ය

උතුරු නැගෙනහිර භාෂණ දෙමළෙහි යෙදෙන වර්තමාන කාලික ප්‍රත්‍ය වශයෙන්-kkiR- , -R- -yiR- ප්‍රත්‍ය දැක්විය හැකියි.

**kuDi + kkiR+ an - kuDikkiRan -** මම බොනවා

2.1 හෙට්ටි ප්‍රජාවගේ භාෂණයේ වර්තමාන කාල භේදය දැක්වීම

හෙට්ටි භාෂණයෙහි **-iya-, -R-, - cciya-, -kkiya-** යන ප්‍රත්‍ය ක්‍රියා මූලයට පරව යෙදේ. kuDicciya , pa:kkiya , po:Ra උදාහරණ වශයෙන් දැක්විය හැකියි.

2.2 උතුරු නැගෙනහිර දෙමළ භාෂණය හා සැසඳීමේ දී හෙට්ටි භාෂණයෙහි වර්තමාන කාල භේදය දැක්වීමේ විශේෂතා

* ක්‍රියාමූලයට පරව **iya** යෙදීම
* **va: , po:, ta:** ක්‍රියාමූලයන්ට පරව **R** යෙදීම
* **pa:r, se:r, tuRa, ke:L, naDa,maRa, kuDu** ක්‍රියාමූලයන්ට පරව **kkiya** යෙදීම
* **kuLi, kuDi, aLi,siRi, iru, katai** ආදී ක්‍රියාමූලයන්ට පරව **cciya** යෙදීම
* උතුරු නැගෙනහිර භාෂණ දෙමළෙහි මෙන් ක්‍රියාමූලයට පරව පුරුෂවාචි, සංඛ්‍යාවාචි සහ ලිංගවාචි ප්‍රත්‍ය යෙදීමක් දැකිය නොහැක.